0041

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2019
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 08 | විෂයය / பாடம் / Subject: ක්‍රිස්තියානි ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I ,II | කාලය / காலம் / Time: පැය 02යි. |

නම:-........................................................ විභාග අංකය:-..................................................

## I කොටස

- පහත සඳහන් සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01. දේව මැවිල්ල තුළ දෙවියන් වහන්සේ මිනිසාට ලබා දුන් විශේෂ අනුග්‍රහය වන්නේ,
 1. ප්‍රථමයෙන් මිනිසා මැවීමයි.
 2. දෙවියන් වහන්සේගේ ස්වරූපය අනුව මැවීමයි.
 3. බලය සහිතව මැවීමයි.
 4. දෙවියන් වහන්සේගේ අභිමතය අනුව මැවීමයි.

02. රතු මුහුද තරණයෙන් පසු කාන්තාරයේ සිටි ජනතාවට දෙවියන් වහන්සේ ජලය ලබා දුන් ස්ථානය වන්නේ,
 1. මාරා 2. හොරෙබ් 3. සීනයි 4. ගිල්ගාල්

03. ජේසුස් වහන්සේ ඉදිරියේ තම නොවටිනාකම හඳුනාගත් ශ්‍රාවකයකු වන්නේ,
 1. ජාකොබ් 2. ඇන්ඩෘ 3. පේදුරු 4. ජුදස්

04. ජේසුස් වහන්සේ ශ්‍රවකයන් දොලොස් දෙනා පිටත්කර හරිමින් ඔවුනට පැවසීමට නියම කළ ප්‍රධාන පණිවුඩය වන්නේ,
 1. ජේසුස් වහන්සේ මොහොතකින් වඩින බව ය.
 2. ස්වර්ග රාජ්‍ය ළංවී ඇති බව ය.
 3. පසුතැවිලි විය යුතු බව ය.
 4. ජේසුස් වහන්සේ පිළිගැනීමට උත්සවයක් සූදානම් කළ යුතු බව ය.

05. ධර්මදූත මෙහෙවරෙහි යෙදෙන අයට ජේසුස් වහන්සේ ලබා දුන් මග පෙන්වීම වන්නේ,
 1. රැකියාවට වඩා මෙහෙවර යොමු වීමට ය.
 2. නිතර විමසිල්ලෙන් ක්‍රියා කරන්න යොමු වන ලෙස ය.
 3. ගමනට සියල්ල සූදානම් කරගත යුතු බව ය.
 4. ලෞකික අවශ්‍යතා මත නොරැඳී දෙවියන් වහන්සේ මත රැඳී සිටීමට ය.

06. යාපනයේ උඩුවිල් ප්‍රදේශයේ වසර 40කට අධික කාලයක් සේවයේ යෙදුනේ,
 1. එලිසා ඇග්නිව් මහත්මිය
 2. ජොයිස් ද සිල්වා මහත්මිය
 3. ඒඩා ප්‍රනාන්දු මහත්මිය
 4. ඉව්ලින් කාති මහත්මිය

07. ජොයිස් ද සිල්වා මහත්මියගේ අර්ථවත් ගීත නිර්මාණයක් වන්නේ,
 1. කුරුසිය ළඟ මෙමා
 2. බෙත්ලෙහෙමේ ගව මඩුවේ
 3. ජේසුගේ ප්‍රේමේ විශාල පුදුමය වේ.
 4. තුති ගී දෙමු දූන්

08. ජේසුස් වහන්සේ පාමුල සිටීමට ප්‍රිය කරන ඔබ
 1. දේවස්ථානයට නොඑන අය කැඳවාගෙන ආ යුතු වේ.
 2. පිරිසිදු ඇඳුමින් සැරසී පැමිණිය යුතු වේ.
 3. සියල්ල අමතක කර උන් වහන්සේගේ වචනය ඇසීමට යොමු විය යුතු වේ.
 4. හොඳින් අධ්‍යාපනය හදාරා නිම කළ යුතු වේ.

09. ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේගේ ක්‍රිස්තුවරයාණෝ යනුවෙන් ප්‍රකාශ කළේ,
1. ජාකොබ් 2. ජොහාන් 3. පේදුරු 4. ජූදස්

10. "මම යහපත් බැටළු එඬේරා වෙමි." යහපත් එඬේරා
1. තම ජීවිතය බැටළුවන් උදෙසා පූජා කරන්නේ ය.
2. තම ජීවිතය රැක ගනු ලබන්නෝ ය.
3. තම ජීවිතයට සැප ගෙන දෙන්නේ ය.
4. බැටළුවන් ආරක්ෂා කිරීමට පියවර ගන්නේ ය.

11. ශුද්ධාත්ම දීමනා අපට ලැබී ඇත්තේ,
1. අපගේ පෞද්ගලික ජීවිතය ශක්තිමත් කර ගැනීමට ය.
2. එකිනෙකා දිරිගැන්වීමටත්, කිතුනු සභාව ශක්තිමත් කිරීමටත් ය.
3. එකිනෙකා අතර බලය පෙන්වීමට ය.
4. සභාවේ භෞතික සම්පත් දියුණුවට අත හිත දීමට ය.

12. පාවුල්තුමා පෙන්වා දෙන පරිදි ශුද්ධාත්ම ඵල ගණන කීය ද?
1. අටයි. 2. නවයයි. 3. හතයි. 4. තුනයි.

13. මැලේරියා රෝගීන් අතර මහඟු සේවයක් ඉටු කළ විදේශීය ජාතික කාන්තාව වන්නේ,
1. ජොයිස් ද සිල්වා 2. ඒඩා ප්‍රනාන්දු
3. තෙරේසා මව්තුමී 4. ඉව්ලින් කානි

14. අන් අය සමග සබඳතාවල දී පීඩා මධ්‍යයේ ගමන් කරන විට වඩා ඉස්මතු විය යුතු ගුණාංගය ඇතුළත් වදත් පෙළ වන්නේ,
1. අධ්‍යාපන සුදුසුකම් වර්ධනය කර ගැනීමට පියවර ගැනීම.
2. සෑම මොහොතේම ඉවසීමෙන් කටයුතු කිරීම.
3. එකිනෙකා ඇසුරින් ඈත්ව සිටීම.
4. පීඩාවන් සැමට පොදු බව තේරුම්ගෙන නිහඬ වීම.

15. නිවෙස තුළ ශුද්ධාත්ම මග පෙන්වීමෙන් ක්‍රියා කරන ඔබ,
1. පවුලේ යාච්ඤාවට උද්යෝගයෙන් සහභාගි විය යුතු වේ.
2. ශබ්ද නගා සෑම මොහොතේ ම ගීතිකා ගායනා කළ යුතු වේ.
3. නිවසේ බයිබල් පාඨ ප්‍රදර්ශනය කළ යුතු වේ.
4. දේශන ඇතුළත් කැසට් පට, ශබ්ද නගා වට පිටාවට ඇසෙන පරිදි දැමිය යුතු වේ.

16. "මොහුත් ආබ්‍රහම්ගේ පුත්‍රයෙකි." යනුවෙන් ජේසුස් වහන්සේ පැවසුවේ කවුරුන් පිළිබඳව ද?
1. සාකෙවුස් 2. සීමොන් 3. පේදුරු 4. ජොහාන්

17. ජේසුස් වහන්සේ දරුවන් වෙනුවෙන් අදාරයෙන් ක්‍රියා කරමින් සුව කළ රෝගය වන්නේ,
1. අංශභාගය 2. උණ රෝගය 3. මී මැස්මොරය 4. ලාදුරු

18. මයිකල් රොද්‍රිගු පියතුමා ...................... ජනතාවගේ ගැටලු පිළිබඳ සොයා බලා කටයුතු කළ දේව සේවකයෙකි.
1. ධීවර 2. ගොවි ජනපදවල 3. වඩු කාර්මික 4. කම්කරුවන්ගේ

19. පංච පුස්තකය ලේඛන ගත කිරීමේ දී උපකතෘ ලෙස කටයුතු කරන්නේ,
1. මිනිසා ය. 2. දෙවියන් වහන්සේ ය.
3. ජේසුස් වහන්සේ ය. 4. මෙසියස් වහන්සේ ය.

20. ජෙරුසලම් පවුර ගොඩනැඟීමට මූලිකව කටයුතු කළේ,
1. එලියා 2. එලිෂා 3. නෙහෙමියා 4. හොෂියා

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. ඉතිරි ප්‍රශ්න අතරින් 04ක් තෝරා පිළිතුරු සපයන්න.

(01) (i) ඒදන් උයනේ භූමියෙන් හටගන්නට සැලැස් වූ ගස් වර්ග 2ක් නම් කරන්න.

(ii) ඊශ්‍රායෙල් ජනතාව දේව සංරක්ෂණය ලද ආකාරය 2ක් ලියන්න.

(iii) ජේසුස් වහන්සේගේ ශ්‍රාවක පිරිස අතර අයකැමියා නම් කරන්න.

(iv) ශ්‍රාවකයන් දොළොස් දෙනාට පැවරූ ධර්ම දූත මෙහෙවරට අදාළ විශේෂ කාර්යයන් 2 ලියන්න.

(v) ආත්ම දමනය යනු කුමක් ද?

(vi) දස පනතේ පනත් අතරින් 2ක් ලියන්න.

(vii) ආදි පියවරු දෙදෙනෙකු නම් කරන්න.

(viii) දිවැසිවරයා හැඳින්වීම සඳහා යෙදෙන හෙබ්‍රෙව් වචනය ලියන්න.

(ix) තොහොමියා මුහුණ දුන් අභියෝගයක් ලියන්න.

(x) ඔබ තුළ තිබිය යුතු යහපත් ගුණාංග 2ක් ලියන්න.

(ලකුණු 2 X 10 = 20)

(02) (i) ජේසුස් වහන්සේ හඳුනා ගැනීම හා පිළිගැනීම නිසා තම ජීවිත වෙනස් කර ගත් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 2)

(ii) ඔබ නම් කරන ලද දෙදෙනාට ජේසුස් වහන්සේ පැවසූ වදන් ලියන්න. (ලකුණු 3)

(iii) ඔබ දේවස්ථානයට මේ වන විට නොපැමිණෙන පිරිස කැඳවා ගැනීමට ඔබට ක්‍රියා කළ හැකි ආකාර 2ක් විස්තර කරන්න. (ලකුණු 5)

(03) (i) ශුද්ධාත්ම ඵල 2ක් නම් කරන්න. (ලකුණු 2)

(ii) ශුද්ධාත්ම දීමනා 3ක් නම් කරන්න. (ලකුණු 3)

(iii) ඔබ නම් කළ ශුද්ධාත්ම දීමනා අනුව අන් අයගේ යහපත උදෙසා ක්‍රියා කරන්නේ කෙසේ දැයි විස්තර කරන්න. ලකුණු 5)

(04) (i) ජේසුස් වහන්සේ ගෙන් සුවය බලාපොරොත්තු වන අය තුළ තිබිය යුතු විශේෂ ලක්ෂණය හඳුන්වන්න. (ලකුණු 2)

(ii) ජේසුස් වහන්සේ ගෙන් දරුවන් වෙනුවෙන් ආදරයෙන් ක්‍රියා කරමින් සුවය ලබා දුන් හා මරණින් උත්ථාන කළ අවස්ථාව නම් කරන්න. (ලකුණු 3)

(iii) ඔබේ මිතුරකු හෝ මිතුරියකු රෝගීව සිටින විට ඔවුන් වෙනුවෙන් කරනු ලබන යැදුමක් ලියන්න. (ලකුණු 5)

(05) (i) ශු. බයිබලය බෙදී ඇති කොටස් ගණන හා එම කොටස්වලට අයත් පොත් ගණන ලියන්න. (ලකුණු 2)

(ii) පංච පුස්තකයට අයත් පොත් 3ක් නම් කරන්න. (ලකුණු 3)

(iii) දස පනතේ පනත් 3ක් ලියා ඒවා පිළිපදින අයුරු ලියා දක්වන්න. (ලකුණු 5)

(06) (i) දිවැසිවරයාගේ කාර්යය භාරය කුමක් දැයි ලියන්න. (ලකුණු 2)

(ii) ජෙරමියා දිවැසිවරයා දුටු දර්ශන 2ක් ලියන්න. (ලකුණු 3)

(iii) ඔබට ලැබෙන දේව කැඳවීම් 2ක් නම් කොට ඔබ ඊට අනුකූලව සේවය කරන අන්දම ලියන්න. (ලකුණු 5)

(07) පහත මාතෘකා අතරින් 2ක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) ඉව්ලින් කානි

(ii) එලීසා ඇග්නිව්

(iii) ශු. බයිබලය

(iv) යහපත් බැටළු එඬේරා (ලකුණු 5 X 2 = 10)